# සන්නස

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**වර්ණ සංයෝජනය**
ඉනෝකා දිසානායක

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055 | **WA** Kapila Hemantha Balage 08 9456 1972 |
| **QLD** Ananada Samaratunga 07 3372 7953 | **ACT** Asoka Nimalasiri 0400 429 031 |
| **SA** Chandta Eeriyagama | **TAS** Anura Seneviratne 03 6327 4259 |

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380



පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත


**අපේ ලිපිනය**
22 Lorne Street
Lalor Vic 3075 Australia
Tel/Fax : 03 9402 5380


## සංස්කාරක සටහන

සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. සන්සේ පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි සිංහල, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.





### අලි කොටි ගිවිසුමට වසර පහයි

# හොර ගිවිසුම් ගැසුවේ මහින්ද ද? රනිල් ද?

**ශ්‍රී ලාල් ප්‍රියන්ත**

**එක්සත්** ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නායක වේළුපිල්ලේ ප්‍රභාකරන් අතර සටන් විරාම ගිවිසුම අත්සන් කරනු ලැබුවේ 2002 පෙබරවාරි මස 21 වැනිදාය. එයට පසුගිය පෙබරවාරි මස 21 වැනිදාට වසර 05 ක් සපිරිණි.

එම පස් වසරක කාල පරිච්ඡේදයට වඩා මෙම කාලය තුළ සටන් විරාම ගිවිසුම පිළිබඳව බොහෝදෙනා තුළ දැඩි කථිකාවතක් රට තුළ ගොඩ නැගී ඇත. එවකට අගමැතිව සිටි රනිල් වික්‍රමසිංහ මහතා වේළුපිල්ලේ ප්‍රභාකරන් සමඟ මෙම ගිවිසුම අත්සන් කළේ ඉතාමත් රහසිගතවය. ඔහු මෙවැනි රහස් ගිවිසුමක් කොටි සමඟ අත්සන් කරන බවට එවකට රටේ විධායක ජනාධිපතිනියව සිටි චන්ද්‍රික බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියවත්, ආණ්ඩු පක්ෂයේ අයවත්, විපක්ෂයේ අයවත්, කැබිනට් එකේ අයවත්, කටුනායකවත්, පාර්ලිමේන්තුවේ අයවත්, රටේ සමස්ත ජනතාවත් කිසිදු දෙයක් දැන සිටියේ නැත.

අඩු තරමින් මෙය රනිල් වික්‍රමසිංහ මහතාගේ බිරිඳවත් දැන සිටියාද යන්න සැක සහිතය. මෙය එතරම්ම රහසිගත හොර ලියවිල්ලකි. වික්‍රමසිංහ මහතා රටේ යහපත පතා මෙය ඉතාමත් සත්භාවයෙන් අත්සන් කළා නම්, රටේ සියලුම ජනතාව දැනුවත් කර බොහෝම විවෘතව අත්සන් කිරීමේ හැකියාව තිබිණි.

නමුත් මෙය හොර රහසේ අත්සන් කිරීමෙන් පැහැදිලි වන්නේ මෙහි කිසිඳු සත්භාවයක් නැති බවය. පිරිසිදු චේතනාවක් නැති බවය. මෙම ගිවිසුමේ සම්පූර්ණ කපුකම සිදුකරනු ලැබුවේ නෝර්වේ රාජ්‍යය විසිනි. එබැවින් කව්රු දැන නොදැන සිටියත් නෝර්වේ ඒජන්තයන් මෙම ගිවිසුමේ ඇති උඩ් යටි අරමුණින් සියල්ල දැන සිටි වගනම් ඉතා පැහැදිලිය.

මෙම ගිවිසුම අත්සන් කිරීමේ අවශ්‍යතාවය ලංකා ආණ්ඩුවටත් වඩා තිබුණේ නෝර්වේ ආණ්ඩුවටය. එබැවින් ගිවිසුම සම්පූර්ණයෙන්ම සකස් කෙරුණේ ඔවුන්ගේ සහ කොටි සංවිධානයේ අවශ්‍යතා සපිරෙන ආකාරයටය. මෙම ගිවිසුම මගින් මුල්වරට ලංකාවේ වෙනම කොටි පාලන කලාපයක් ගැන සඳහන් කර ඇත.

එතෙක් කලක් ලංකාව තුළ වෙනම රාජ්‍යයක් හෝ වෙනම කලාපයක් පිළිබඳව කොතනකවත් සඳහන් වී තිබුණේ නැත.. නමුත් මෙම ගිවිසුම මගින් ඒ බව තහවුරු කිරීමෙන් එහි බරපතල තත්ත්වය කොතෙක්ද යන්න ඕනෑම අයෙකුට මනාව වැටහෙනවා ඇත. නෝර්වේ රාජ්‍යය යනු ඇමරිකානු අවශ්‍යතාවයට සරිලන ආකාරයට කටයුතු කරන රටකි. එබැවින් ඔවුන් නිතරම උත්සාහ කරන්නේ රටවල් එකතු කරමින් ජනතාව සමගි කිරීම නොව, රටවල් බෙදා වෙන් කරමින් ජනතාව භේද බින්න කිරීමටය. එය අධිරාජ්‍යවාදී අවශ්‍යතාවයකි. නෝර්වේ රාජ්‍යය මෙම ගිවිසුම හරහා සිදුකර ඇත්තේත් එවැනි දෙයකි.

මෙම ගිවිසුම ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ස්ථාපිත කර ඇති නීති පද්ධතියට කිසිසේත්ම අනුකූල නොවේ. එමගින් සිදුවී ඇත්තේ ලංකාවේ ස්වෛරීභාවයට, ස්වාධීනත්වයට, භෞමික අඛණ්ඩතාවයට හා රටේ ප්‍රජාතන්ත්‍රවාදී පසුබිමට දැඩි තර්ජනයක් එල්ල කිරීමය.

මෙය ''සටන් විරාම ගිවිසුමක්'' ලෙස අර්ථ දක්වා අත්සන් කළත්, ඉන් විරාමය ඇති වුණේ ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආරක්ෂක අංශවල තුවක්කුවලට මිස කොටින්ගේ තුවක්කුවලට නොවේ. සටන් විරාම නිරීක්ෂකයන්ටත් ඇහැ ඇරෙන්නේ, කට ඇරෙන්නේ, අතපය දිගහැර යෝදයන් ලෙස නැගී සිටින්නේ රජයේ හමුදාව තුළින් වෙඩි පත්තු වුවොත් පමණි. කොටි තුවක්කු වලින් වෙඩි පිට වෙඩි පත්තු වුවත්, ඇහැ ඇරෙන්නේ නැත. කට ඇරෙන්නේ නැත. ගොළුවන් බිහිරන් සේ ඇස් කන් පියාගෙන බොහෝම සුවසේ නිදා ගෙන සිටී.

එසෙ නම්, එවැනි සටන් විරාම නිරීක්ෂකයන් පිරිසකගේ ඇති ඵලය කුමක්ද? එවැනි සටන් විරාම ගිවිසුමකින් ඇති තේරුම කුමක්ද? මෙය මතුපිටින් සටන් විරාම ගිවිසුමක් ලෙස අර්ථ දැක්වූවත්, එහි එවැන් ස්වභාවයක් තිබුණේ නැත. මෙය තනිකරම කොටින්ට වෙනම ඊළාම් රාජ්‍යයක් ඇති කර ගැනීම උදෙසා අවශ්‍ය කරන මූලික පසුබිම ගොඩනැගීම පිණිස අත්සන් කරන ලද හොර ලියවිල්ලකි.

එක් පැත්තකින් මෙය පිරිසිදු චේතනාවෙන් අත්සන් කරන ලද ගිවිසුමක් නම්, දෙපාර්ශවයම එකම ස්ථානයක සිට බොහෝම විවෘතව ලෝකයා ඉදිරියේ එය අත්සන් කිරීමේ හැකියාව තිබිණි. නමුත් මෙහි එබඳු තත්ත්වයක් දක්නට ලැබුණේ නැත. රනිල් වික්‍රමසිංහ මහතා ගිවිසුමට අත්සන් කළේ කොළඹ සිටය. වේළුපිල්ලේ ප්‍රභාකරන් එයට අත්සන් තැබුවේ මුලතිව් මහා වනාන්තරයේ නොපෙනෙන තැනක සිටය. එම ගිවිසුම් පිටපත් දෙපාර්ශවය අතර හුවමාරු කළේ නෝර්වේ ඒජන්තයින් විසිනි.

මෙය අත්සන් කිරීම හා ඉන්පසු පැවැති ස්වභාවය කිසිඳු දේශ හිතෛෂියෙකුට පිළිගැනීමට පුළුවන් ආකාරයට තිබුණේ නැත. මෙය සටන් විරාම ගිවිසුමක් ලෙස අත්සන් කළත්, කොටි සංවිධානය එය මේ වනවිට 8000ක් වතාවකට වඩා කඩ කර ඇත. රජයේ පාර්ශවයෙන් එම තත්ත්වය ඇති වී ඇත්තේ ඉතාමත් සුළු වශයෙනි.

මෙම තත්ත්වය හේතු කොට ගෙන නෝර්වේ රාජ්‍යය හෝ සටන් විරාම නිරීක්ෂණ කමිටුව කොටි සංවිධානයට එරෙහිව ගත් ක්‍රියා මාර්ගය කුමක්ද? කිසිම දෙයක් නැත. සිදුවූයේ කොටින්ට ගිවිසුම හරහා තවදුරටත් ශක්තිමත්වීම උදෙසා නෝර්වේ රාජ්‍යය මගින් අවශ්‍ය පහසුකම් සැපයීමය.

කොටි සංවිධානයෙන් වෙන් වී ගිය එහි සන්නද්ධ අංශයේ හිටපු නායක කරුණා අම්මාන් පසුගියදා ජනමාධ්‍යයට ප්‍රකාශයක් කරමින් නෝර්වේ රාජයය කොටින්ට දුන් පහසුකම් පිළිබඳව විශේෂ හෙළිදරව්වක් කර තිබිණි. කොටින්ට ආයුධ මිලදී ගැනීමට මුදල් ලබාදුන් හැටි, ප්‍රභාකරන්ට රූපවාහිනී යන්ත්‍ර පිරිනැමූ හැටි, අධි තාක්ෂණික උපකරණ සැපයූ හැටි, යුද පුහුණුවට හා වෙනම රාජ්‍යයක් පිළිබඳ උපදෙස් දුන් හැටි කරුණා අම්මාන් එමගින් හෙළි කර තිබිණ.

සටන් විරාම ගිවිසුමක් හරහා නෝර්වේ රාජ්‍ය හා සටන් විරාම නිරීක්ෂණාන නියෝජිතයෝ ලංකා රාජ්‍යයට ගොඩ බැස්සේ කොටි සහ රජය අතර සැබෑ සටන් පැවැත්වීමක් ඇති කර රටට සාමය ගෙන දෙන බවට පුරසාරම් දොඩවමිනි. නමුත් ඔවුන් සාමයට මුවා වී කර ඇත්තේ ශ්‍රී ලංක රාජ්‍යය දුර්වල කරමින් කොටින්ට වෙනම රාජයයක් ස්ථාපිත කර ගැනීම උදෙසා අවශ්‍ය පහසුකම් සැපයීමට බව කරුණා අම්මාන්ගේ හෙළිදරව්වෙන් පැහැදිලි වේ. එසේනම් මෙවැනි සටන් විරාම ගිවිසුමකින් හෝ නෝර්වේ රාජ්‍යයේ නියෝජිතයින් පිරිසක ගෙන් හෝ ඇති ඵල ප්‍රයෝජනය කුමක්ද? මෙම ප්‍රශ්නය හා විවේචනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පුමුඛ පොදුජන එක්සත් පෙරමුණ, එක්සත් ජාතික නිදහස් සන්ධානය, හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග හා වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙතින් ප්‍රබලම නිරතුරුව  එල්ල වු දෙයකි.පසුගිය ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතා ''මහින්ද චින්තන'' වැඩපිළිවෙල හරහා ජනතාවට ප්‍රකාශ කර සිටියේ තම පාලනයක් මගින් ''සටන් විරාම ගිවිසුම'' ඉරා දමන බවය. නමුත් ඔහු බලයට පත්වී දැනට වසරකුත් මාස තුනක් පමණ ගතවී ඇත. අද වනතුරුත් එය ඉරා දමා නැත. එවැනි බවක් තිබෙන ස්වභාවයක්වත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තුළ දක්නට නැත.

දැන් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රකාශ කරන්නේ අමුතු කතාවකි. ඔහු පසුගිය පෙබරවාරි මස 24 වැනිදා රාත්‍රී සියලුම විද්‍යුත් මාධ්‍ය හරහා ''ජනපති ජන හමුව'' වැඩසටහනට සහභාගි වෙමින් ප්‍රකාශ කර සිටියේ ''සටන් විරාම ගිවිසුම තිබුණාත් එකයි. නැතත් එකයි. මගේ වැඩ ටික මම කරගෙන යනවා. මගේ වැඩ වලට යම් බාධාවක් වුණොත් අන්න එදාට මම තීරණයක් ගන්නවා'' යනුවෙනි.  රටේ විධායක ජනාධිපතිවරයා හෙවත් ප්‍රධාන පුරවැසියා වන මහින්ද රාජපක්ෂ මහතා එසේ ප්‍රකාශ කරන විට ඔහුගේම ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙකු වන නිමල් සිරිපාල ද සිල්වා මහතා ප්‍රකාශ කරන්නේ ''තම ආණ්ඩුව සටන් විරාම ගිවිසුම ආරක්ෂා කිරීමට උපරිම වශයෙන් බැඳී සිටින බවය. එපමණක් නොව, එම ගිවිසුමේ එක් වගන්තියක් හැර සියලුම වගන්ති පිළිගන්නා බවද ඔහු කියා සිටී.  විශේෂයෙන්ම ඔහු මේ බව ප්‍රකාශ කර සිටියේ 2006 පෙබරවාරි මස 22 සහ 23 යන දිනවල ස්විට්සර්ලන්තයේ ජීනිවා නුවර පැවැති සාම සාකච්ඡා වලදීය. මෙමගින් පැහැදිලි වන්නේ කුමක්ද? ආණ්ඩුව ''සටන් විරාම ගිවිසුම'' ගැන කිසිඳු පැහැදිලි අවබෝධයක්, වැඩ පිළිවෙලක් හෝ ප්‍රතිපත්තියක් නැති බවය.

සන්නස පෙබරවාරි කළාපයේ ''ජෝති ඔහු නිවැරදිද'' ලිපිය Macquarie හි ජයන්ත ප්‍රේමචන්ද්‍ර මහතා විසින් ලියන ලද්දක් බව කරුණාවෙන් සළකන්න.